ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2203/34 - 2020 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2020.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/1940 (III)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නිවේදනය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, දිසානායක මුදියන්සේලාගේ සෙනරත් බණ්ඩාර දිසානායක වන මා විසින්, එකී වගන්තියේ විධිවිධානවලට අනුකූල වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්ය සඳහා "පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්" ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**සෙනරත් දිසානායක,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2020 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

ඩෙල්ෆ්ට් දූපතේ පුරාවිද්‍යා නටබුන් සහිත විහාර සංකීර්ණ පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමියට අයත් භූමි ප්‍රදේශය.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඩෙල්ෆ්ට් බටහිර අංක J 01 දරන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, අක්කර 1, රූඩ් 2 සහ පර්චස් 21.07ක වපසරියකින් සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ භාර මැනුම් අධිකාරි විසින් මැන සාදන ලද 1977 දෙසැම්බර් මස 29 වැනි දිනැති අංක යා 1416 දරන භූ ලක්ෂණ මූලික පිඹුරේ නිරූපණය වන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 1 ලෙස නිරූපණය වන ඩෙල්ෆ්ට් දූපතේ පුරාවිද්‍යා නටඹුන් සහිත විහාර සංකීර්ණ පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමිය ලෙස හඳුන්වනු ලබන බෙදන ලද සහ නිශ්චිතව දක්වන ලද ඉඩම් කොටස.

12 - 126